---

**කැකිරාව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

## 1. **මූල්‍ය ප්‍රකාශන**

---

### 1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

#### 1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---

(අ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලෙස ලබාගෙන තිබුණු රු.7,900,688 ක් ණය වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ). බේකරි නිෂ්පාදන උපකරණ තොගයේ වටිනාකම රු.7,326,000 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඇ). උසාවි දඩ ආදායම් හා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.2,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). ලැබුණු ආදායම් විෂයයන් 03 ක එකතුව රු.1,096,330 ක් සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් වශයෙන් ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ඉ). සභාව විසින් ඉදිකරන ලද ගරාජයේ රු.1,563,750 ක්වූ පිරිවැය ප්‍රාග්ධනගත කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 47,752,469 ක්වූ වත්කම් විෂයයන් 02 ක් හා ආදායම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,823,296 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,422,031 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

**----------------**

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 10(3) හි විධිවිධාන වලට පටහැනිව උප කාර්යාලයක් මගින් රැස් කරනු ලැබූ රු.1,143,726 ක මුදලක්

වර්ෂයකට අධික කාලයක් සභා අරමුදලට බැර නොකර රැස් කිරීමේ ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ). රාජකාරි පැවරීම, අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන පරිදි වැඩ බෙදීම සිදුකර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 6,136 | 5,486 | 2,023 |
| (ii). | බදු කුලී | 3,121 | 2,501 | 619 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 2,301 | 3,125 | - |
| (iv). | වෙනත් ආදායම් | 84,426 | 59,044 | 25,382 |

### 2.3.2 වරිපනම් හා බදු

වරිපනම් සඳහා දේපල තක්සේරු කිරීම යාවත්කාලීනව සිදුනොකර 2004 වර්ෂයේදී සිදුකල තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකරමින් පැවතුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ). මුද්දර ගාස්තු

ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු වාර්තා හා සභාවේ ආදායම් වාර්තා අනුව 2012 දෙසැම්බර්31 දිනට 2010 වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම

රු.3,844,851 ක්වූ අතර 2011 හා 2012 වර්ෂ සඳහා ලැබිය යුතු ආදායම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). **උසාවි දඩ**

**------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු තිබු උසාවි දඩ ආදායම රු.53,087,965 ක් විය.

**2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

**-------------------------------------------------**

සභාවට අයත් රු.200,000 ක් වටිනාකම වූ නිල නිවාස 02 ක් මාස 07 කට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**2.5 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

ඇස්තමේන්තුගත වියදම රු. 26,932,266 ක් වූ පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද සභාවේ නගර ශාලාව නවීකරණය හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2010 අප්‍රේල් 14 දින ගිවිසුමකට එළඹ තිබු අතර 2012 දෙසැම්බර් 31 දිනට වියදම රු. 25,753,290 ක් විය. 2013 මාර්තු 08 දින කරන ලද භෞතික පරීක්ෂණයේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ගොඩනැගිලි බිත්ති හා වහල අතර පරතරය ආවරණය කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ල තුලට සතුන්ට ඇතුළු වී හානි සිදු කිරීමට ඉඩ සැලසී තිබුණු අතර ගෙබිම ටෙරාසෝ මතුපිට පුපුරා ගොස් තිබුණි.

(ආ). ගොඩනැගිල්ල නවීකරණය කිරීමේදී භාවිතයට ගන්නා ලද පැරණි යකඩ (ලින්ටල්) සම්බන්ධව තත්ව පාලන වාර්තා ලබාගෙන නොතිබුණි.

**2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

සහල්පිටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ අරමුණින් උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හා කැකිරාව ප්‍රාදේශීය සභාව ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාරව සහල්පිටි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම සඳහා 2008 වර්ෂයේදි වැය කරන ලද රු.2,251,900 ක වියදම අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකිවීම නිසා නිශ්ඵල වී තිබුණි. මෙම සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා වන විකල්ප ක්‍රියාමාර්ගයක් කෙරෙහි වගකිවයුතු පාර්ශ්වයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

**2.7** සනඅපද්‍රව්‍ය කළමනාකරණය

**---------------------------------**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණු හෙයින් කසල බැහැර කිරීම සම්බන්ධව සතුටුදායක තත්ත්වයක් නිරීක්ෂණය නොවීය. 2009 වර්ෂයේදී රු.3,618,563 ක වියදමින් ඉදිකරන ලද කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයද නිශ්ක්‍රියව පැවතුණි.

**3. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර විගණනය

(ආ). මානව සම්පත් කළමනාකරණය

(ඇ). ආදායම් පරිපාලනය.